# බිත්තර රැකීම පිළිබඳ උපදෙස්

**එස්. එන්. දිසානායක විසිනි**

කිකිළි බිත්තරයකින් පැටවෙකු බිහිවීමට දින 21 ක්, ගතවන අතර, තාරා බිත්තර වලින් දින 28කින්, පැටව් එළියට එති. පාත්ත බිත්තරවලින් පැටව් උපදීමට දින 28ක්, ගතවන අතර ගිනි කිකිළි බිත්තර දින 24-25 දක්වා කාලයකින් පිපිරෙයි.

විශාල වශයෙන් පැටව් බෝකරන ගොවි පළවල් තුළ හා රැකුම්හල්වල ස්වාභාවික ක්‍රමය අනුව බිත්තර රක්කවීම ක්‍රියාවේ යෙදිය නොහැකි දුෂ්කර කාර්යයකි. කිකිළි යන් ස්වල්ප දෙනෙක් තම නිවස අසල තබා ගන්නා අය පමණක් ස්වාභාවික බිජු රැකීමේ ක්‍රමය ක්‍රියාවේ යොදති.

**බිත්තර තේරීම හා රක්කවීම**

මනාලෙස බිත්තර රක්කවීම සඳහා උප දෙස් ස්වල්පයක් පිළිපැදිය යුතුය. සාමාන්‍ය යෙන් රක්කවීම සඳහා තබන බිත්තර වලින් සියයට 25-30 දක්වා ප්‍රමාණයක් නරක් වෙති.

සාමාන්‍යයෙන් අවුන්ස 2-2½ දක්වා බරැති බිත්තර රක්කවීම සඳහා යෝග්‍යය. මීට වඩා ලොකු හෝ කුඩා බිත්තර රක්කවීම සඳහා නොගත යුතු අතර, සිනිඳු කටුවක් ඇති බිත්තර පමණක් රැකීම සඳහා ගත යුතුය. දිගටි, උල්වූ හා අවශ්‍ය පමණට වඩා රවුම් වූ බිත්තර රැකීම සඳහා නොගත යුතු අතර පිපිරුණු හෝ ඉරිතැලී ගිය බිත්තරද, මේ සඳහා නොගත යුතු වෙයි. රක්කවීම සඳහා තෝරාගත් බිත්තර "ෆැරන්හයිට්" අංශක 60ක, උෂ්ණත්වය යටතේ, ගබඩාකර තැබිය යුතු අතර, දින දහයකට වඩා ගබඩා කර තබා ගත යුතු නොවේ.

කුණු තැවරුණ අපිරිසිදු බිත්තර කම්බි වූල්වලින් මැද පිරිසිදු කල යුතු අතර, බිත්තර සෝදා කුණු ඉවත් කල යුත්තේ එසේ නො කොට බැරිම අවස්ථාවක් වූවොත් පමණි. රක්කවීම සඳහා වෙන් කොට ඇති බිත්තර ජලයෙන් සේදීමේ දී ඒවාට විෂබීජ ඇතුල් වීමට ඉඩ තිබේ. එසේ බිත්තරවල කුණු සෝදන ජලය වුවද, ෆැරන්හයිට් අංශක 80-85 දක්වා උෂ්ණ මට්ටමක් තිබිය යුතු අතර, එම ජලයට විෂබීජ නාශක දියරයක් එක්කොට තිබිය යුතුය. රක්කවීම සඳහා ගන්නා බිත්තර අවශ්‍ය පමණට වඩා සෙල වීමෙන් හා එසා මෙහා ප්‍රවාහණය කිරීම ආදියෙන් එහි ඇති පැටව් බිහි කිරීමේ ශක්තිය නොමැති වී යාමට ඉඩ ඇත.

**පැටවාගේ වැඩීම**

නියම ක්‍රමයට රක්කන ලද බිත්තරයක දින හතරක් ගත වූ පසු පිහාටු හා කකුල් පැහැදිළිව වෙන් වී ඇත. එමෙන්ම දින හතරක් ගත වූ බිත්තරය තුළ පැටවාගේ මොලය හා ස්නායු පද්ධතියද, වැඩෙන්නට පටන්ගෙන ඇත. හය වෙනි දිනයේ දී කකුල්වල හා පිහාටුවල කොටස් වෙන් වී ඇත. නවවෙනි දිනයේ බිත්තරය තුළ ඇති කලල රූපය කුකුල් පැටවෙකුගේ හැඩය ගනී. පසලොස්වෙනි දිනයේ බිත්තරය තුළ පැටවාගේ ඇට කටුවල චූර්ණකරණය (Calcification) සිදුවී ඇති අතර, දහසය වන දිනයේ පැටවාගේ නිය හා හොටය සෑදේ. මේ අනුව තද විදුලි එළියක් යෙදු උපකරණයක් මගින් බිත්තරයේ ඇතුලත ස්වභාවය දැකගත හැකි බැවින් ඒ අනුව නරක් වූ බිත්තර ඉවත් කල හැක.

බිත්තරය තුළ පැටවා වැරදි අතට සිටීමෙන් දින 21 ක්, ගත වුවද පැටවා එළියට නොඑනු ඇත. මෙසේ සිදුවන්නේ බිත්තරය නියම ක්‍රමයට හැරවීම සිදු නො වීම හා ආරයන්ගේ ආවේණික ගතිගුණ අනුවය.

නියම ක්‍රමයට බිත්තරය තුළ පැටවා පිහිටා ඇතිවිට, ඌගේ හොටය බිත්තරයේ පළල පැත්තේ, තිබිය යුතුය.

කකුල් දෙක අතරින් ඔළුවද, පැටවා ගේ ශරීරය බිත්තරයේ පළල් අතටද, ඔළුව උඩින් කකුල් ද, පිහාටු උඩින් ඔළුවද, ආදී වශයෙන් පැටවාගේ ශරීරය නොයෙක් ආකාරවලට පිහිටීමෙන් පැටවා නිසි ක්‍රමයට බිත්තරයෙන් එළියට නොඑනු ඇත.

රක්කන බිත්තර හොඳින් ආරක්ෂා කර ගත යුත්තේ 3 වෙනි හා 5 වෙනි දිනවල හා 18 වෙනි හා 19 වෙනි දිනවලය.

කෘත්‍රිම ක්‍රමයට බිත්තර රක්කවීමේදී පිළිපැදිය යුතු එක් වටිනා උපදේසයක් නම් රක්කනය නිෂ්පාදනය කර ඇති අයගේ උපදෙස් අකුරටම පිළිපැදීමේ ඇති වටිනාකමයි. සාර්ථක ලෙස බිජු රක්කවීම සඳහා පහත සඳහන් අවශ්‍යතාවයන් තිබිය යුතුය.

(අ) නියමි උෂ්ණත්වය
(ආ) නියම ආර්ද්‍රතාවය
(ඇ) නියම වාතාශ්‍රය.

### උෂ්ණත්වය

රක්කන කිකිළියන්ගේ ඇති උෂ්ණත්වය පැරන්හයිට් අංශක 105 සිට පැරන්හයිට් අංශක 107 දක්වා වෙයි. නියම ක්‍රමයට බිත්තරය රකීමට නම් බිත්තරය මැද ඇති උෂ්ණත්වය පැරන්හයිට් අංශක 100ක්, විය යුතුය. ඒ අනුව බිත්තරයේ පිටකටුව මතු පිට තිබිය යුතු උෂ්ණත්වය පැරන්හයිට් අංශක 103ක්, විය යුතුය. නිශ්චල සුළඟ ඇති රක්කනයන් තුළ ඉහත කී උෂ්ණත්වය තිබිය යුතු අතර, චංචල සුළඟ ඇති, සුළං පෙති යෙදූ රක්කනයන් තුළ තිබිය යුතු උෂ්ණත්වය මට්ටම පැරන්හයිට් අංශක 100කි.

මෙසේ රක්කනයන් දෙවර්ගය තුළ ඇති උෂ්ණත්ව මට්ටම් දෙක අතරතුර පැරන්හයිට් අංශක තුනක වෙනසක් ඇත. ඒ සවාභාවික ලෙස උෂ්ණ වූ සුළඟ උඩට ගමන් කරන රක්කනයන් තුළ ඇති වායුමය තට්ටු වල උෂ්ණත්වය වෙනස් වන සුළු බැවිණි. සුළං පෙති යෙදූ රක්කනයන් තුළ ඇති බිත්තරවල පිටත හා ඇතුළත එකම උෂ්ණත්ව මට්ටමක් ඇත. විශාල රකුම්හල් ඇති සමහර ගොවිපළවල් තුළ රකින බිත්තර වලට දින 18ක්, ගත වූ පසු උෂ්ණත්වය අංශක 99-99½ දක්වා උෂ්ණත්ව මට්ටමක් ඇති වෙනත් ස්ථානයකට මාරු කරනු ලැබේ. එසේ අඩු උෂ්ණත්වයක් ඇති ස්ථානයකට මාරු කරනු ලබන්නේ දින 18කින්, පසු බිත්තරයේ වැඩෙන පැටවා ගෙන් ද, යම්කිසි උෂ්ණත්වයක් නිකුත් වන බැවිනි.

### ආර්ද්‍රතාවය

වාතයේ ඇති සවාභාවික තෙත ප්‍රමාණය ආර්ද්‍රතාවය නම් වෙයි. මෙය සාමාන්‍යයෙන් දක්වනුයේ සියයට ප්‍රමාණයක් වශයෙනි. රකින බිත්තර මනාලෙස රක්කවීම සඳහා රක්කනය තුළ ඇති වාතයේ තෙතමනය තිබිය යුතුය. එසේ නොමැති වූවොත් බිත්තරය තුළ පැටවා මැරෙනවා ඇත. එමෙන්ම අවශ්‍ය පමණට වඩා වුවද, වාතයේ තෙතමනය ඇතිවීමෙන් රක්කවීමට තබා ඇති, බිත්තර කුණු වී යනවා ඇත. වාතයේ ඇති තෙතමනය මනිනු ලබන්නේ වියළි-තෙත් බල්බ උෂ්ණත්ව මානයෙකිනි. ඒ අනුව කැබිනට්ටුවකින් සමන්විත වූ විශාල රක්කනයක වියළි බල්බයේ උෂ්ණත්ව මට්ටම පැරන්හයිට් අංශක 100ක් විය යුතු අතර, තෙත් බල්බයේ උෂ්ණත්වය පැරන්හයිට් අංශක 88ක්, විය යුතුය.

### සංවාතනය (VENTILATION)

බිජු රක්කනය තුළ ඇති අංගාරිකාම්ල වායුව (Carbon Dioxide) වැනි විෂ වායු පිට කිරීමටත් අම්ලකර වායුව (Oxygen) වැනි වායු අවශ්‍ය පමණ ඒ තුළට ඇතුළු කිරීමටත් සංවාතනය අවශ්‍ය වෙයි. එබැවින් බිජු රක්කනය පිහිටි කාමරය පිරිසිදු වාත යෙන් පිරී පැවතිය යුතුය. එමෙන්ම කාමරය තුළ සුළං හමා යෑම තදින් සිදු නොවනසේ කාමරයේ ඇති විශාල සුළං කපොලු වසා ඇමිය යුතුය. එවිට රක්කනයේ පැතිවලට තද සුළං පහරවල් නොවදිනවා ඇත.

### රක්කන බිත්තර තැබිය යුතු පිළිවෙළ

රක්කන බිත්තර තැබිය යුත්තේ පැතලි අතට හෝ මහත පැත්ත උඩට සිටින ලෙසටය. සුළං පෙති නොමැති යන්ත්‍රවල, රක්කන



**රකින බිත්තරයේ අවස්ථා—**

**ඉහළ පෙළ—( 7 වන දිනය) —**

**වමේ**—පැහැදිලි බිත්තරය

**මැද**—සරු බිත්තරය

**දකුණේ**—තුවාල වූ කහ මදය

**මැද පෙළ—(14 වන දිනය) —**

**වමේ**—අවශ්‍ය පමණට වඩා වියළුණු බිත්තරය.
(තෙතමනය අඩුකම නිසා)

**මැද** — නියම පමණට වියැළුණු බිත්තරය

**දකුණේ**—වියළි මද බිත්තරය
(වැඩි තෙතමනය)

**පහළ පෙළ—**

**වමේ**—5 වන දිනයේ මළ කළලයක්

**මැද**—20 වන දිනයේ පුපුරන්ට කිට්වූ බිත්තරය

**දකුණේ**—14 වන දින කළලය මැරී

**පහළ—**

**වමේ**—කහමදය හා ජන්මානුව සුදු තිතක් ලෙස පෙනේ

**දකුණේ**—14 — 15 දක්වා දින ගණනක් රකින ලද කුකුළු පැටියා

බිත්තර පැතලි අතටද, සුළං පෙති ඇති යන්ත්‍රවල රක්කන බිත්තර මහත පැත්ත උඩට සිටින ලෙසටද, තැබීම යෝග්‍යය.

### රක්කන බිත්තර පෙරළිය යුතු පිළිවෙළ

මනාලෙස රක්කන ලද බිත්තර අතින් හෝ ස්වයංකාරී ක්‍රමයට පෙරළිය යුතුය. මේ මගින් උෂ්ණ වායුව බිත්තරයේ සෑම පැත්ත කටම එකසේ ලැබෙන අතර, බිත්තරය තුළ ඇති සිවිය කළලයට ඇලී නොතිබෙයි. බිජු රකින පළමු දින දහ අට තුළ බිත්තර පෙරලීම වැඩියෙන්ම අවශ්‍ය වන අතර, දින දහ අටකින් පසු බිත්තර පෙරලීම සම්පූර්ණ යෙන් නතර කළ යුතුය. පැතලි අතට බිත්තර තබා ඇති කුඩා රක්කනයන් තුළ රක්කන බිත්තර දිනකට 3-5 දක්වා වාරයක් පෙරළිය යුතුය. ඒසේ බිත්තර ඔත්තේ වාරයක් පෙරළිය යුත්තේ නොකඩවා දින දහ අටක් සෑමදාම දීර්ඝ රාත්‍රිකාලයෙහි එකම අතට බිත්තර නොපිහිටන ලෙසටය. සෑම පැයක්

පාසාම බිත්තර පෙරළෙන යාන්ත්‍රික ක්‍රමය අනුව ඉහත කී අන්දමේ අතින් බිත්තර පෙරලීමක් අවශ්‍ය නොවේ.

## බිත්තර රක්කවීම අසාර්ථක වීමට හේතු

සාමාන්‍ය කාලයට වඩා බිත්තර පිපිරීම සඳහා කල්ගත වේනම් ඔබ සමහර විට රකීම සඳහා ගෙන ඇත්තේ මළ ජීවියක් ඇති පරණ බිත්තර විය හැක. එසේත් නොමැති නම් රක්කනයේ ඇති උෂ්ණත්ව මට්ටම අඩු විය හැක. බිත්තර ඉක්මණින් පුපුරයි නම් රක්කනය තුළ වැඩි උෂ්ණත්වයක් ඇති නිසා විය හැක. බිත්තර කට්ට තුළ පැටවා මැරී ඇත්නම් බිත්තර වැරදි ක්‍රමයට පෙරළීම බෝ කිරීමේ වැරදි ක්‍රම, රෝග, නිසි ආහාර පදාර්ථයන් නොලැබීම, ආදිය විය හැක. දුර්වල කුකුළු පැටවු බිහිවන්නේද, උෂ්ණත්වය වැඩි කමිනි. කටුව තුළ සිවිය ඇලී ඇති පැටවුන් ඇති වන්නේ ද, උෂ්ණත්වය වැඩි බැවිනි. බිත්තරයෙන් බිහිවන පැටවා ඉතා කුඩා වන්නේ තෙතමනය අවශ්‍ය පමණට නොලැබී යාම හා කුඩා බිත්තර **රක්කවීම සඳහා උපයෝගී කර** ගැනීම නිසාය.

පැටවුන් බෝ නොවෙන බිත්තර ඇති වන්නේ කුකුළු ගෙවල තුළ අවශ්‍ය පමණට කුකුළන් නොමැති වීමෙන් හෝ කුකුළන් වයස්ගත වීම නිසා හෝ කිකිළියන්ගේ තෙල් මන්ද වැඩි වීම නිසා හෝ නුසුදුසු තත්ත්වයන් යටතේ රකීමට ගන්නා බිත්තර ගබඩා කර තැබීම නිසා විය හැක.

## ස්වාභාවික ක්‍රමයට බිත්තර රකීම

රකින කිකිළියන් යොදා බිත්තර රක්ක වීම සුළු වශයෙන් කිකිළියන් ඇති කරන සාමාන්‍ය අයට වුවද ක්‍රියාවේ යෙදිය හැකි පහසු ක්‍රමයකි. එක් රක්කන කිකිළියකට බිත්තර 12-15 දක්වා ප්‍රමාණයක් රක්කිය හැක. බිත්තර රකීමට සුදුසු කිකිළිය බිජු දමන පෙට්ටිය තුළ රෑ දවල් සිටී. කවුරු හෝ මේ කිකිළිය වෙත ළං වුවහොත් ඇ පිහාටු පුප්පා ගන්නිය. සමහර විට ඇගේ ශරීරයේ යටි පැත්තේ ඇති පිහාටු ස්වල්ප ප්‍රමාණයක් හැලී ඇත. කිකිළියකට බිජු රකීමට දීමට ප්‍රථම කෘත්‍රිම බිත්තර ඇයට භාර දී ඇත්ත වශයෙන් ම ඇ බිජු රකිද, යනු සොයා බැලිය යුතුය. බිජු රකින පෙට්ටියක් සාමාන්‍යයෙන් අඟල් 14×14 ප්‍රමාණය විය යුතු අතර, ගැඹුර අඟල් 10ක් පමණ විය හැක. මෙම පෙට්ටියේ අඩිය පිදීසියක හැඩයට බොකුටු ගැසී ඇතොත් බිත්තර එක එක අතට පෙරළී නොයනවා ඇත. එමෙන්ම පෙට්ටියේ යටට පිදුරු හා දහයියා ඇමීම යෝග්‍යය. කිකිළියට රක්කන බිත්තර භාර දීමට ප්‍රථම කෘමි නාශක කුඩකින් ඇගේ ශරීරයේ ඇති නොයෙක් පරපෝෂිතයන් විනාශ කළ යුතුය. ඇයට ඉන්පසු පෙට්ටියෙන් ඉවතට යෑමට අවසර දිය යුත්තේ දිනකට මිනිත්තු දහයක් පමණි. ඒ කාලය තුළ ඇය ආහාර ගැනීම පිපාසය සංසිඳුවා ගැනීම, මළ පහ කිරීම ආදී කටයුතු කරගත යුතු වෙයි. බිත්තර පිපිරී පැටවු එළියට ආ පසු රක්කන පෙට්ටිය තුළ ඇති බිත්තර කටු හා වෙනත් කුණු ආදිය ඉවත් කළ යුතු වෙයි. නොපිපිරුණු බිත්තර ද, ඉවත් කළ යුතුය. ඉන්පසු කුණු තැවරී ඇති පිදුරු ආදියද, ඉවත්කොට නැවතත් පාවිච්චි කිරීම සඳහා තැබිය යුතු වෙයි.

**නිමි.**